# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2122/29 - 2019 මැයි මස 08 වැනි බදාදා - 2019.05.08

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී )

# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

### ඌව පළාතේ පළාත් සභාව

ඌව පළාත් ප්‍රධාන අමාත්‍ය හා පළාත් පාලන විෂයභාර අමාත්‍ය දොන් ආතර් චාමර සම්පත් දසනායක වන මා විසින්, 1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතෙහි 2 වන වගන්තිය සමග කියවිය යුතු 252 අධිකාරය වන මහා නගර සභා ආඥා පනතේ 289 වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව සාදන ලද මහා නගර සභා නගරාධිපති, නියෝජ්‍ය නගරාධිපති හා නාගරික මන්ත්‍රීවරුන් සඳහා පහත සඳහන් දීමනාවලට අදාළ නියෝග මෙයින් පනවනු ලැබේ. ඉන්ධන හා දුරකථන දීමනා සම්බන්ධව මෙම නියෝග 2018.06.30 දින සිට ක්‍රියාත්මක විය යුතු අතර සංයුක්ත දීමනා හා කමිටු සඳහා සහභාගී වීමේ දීමනාව සම්බන්ධ නියෝග 2019.02.01 දින සිට ක්‍රියාත්මක විය යුතුය.

**දොන් ආතර් චාමර සම්පත් දසනායක,**
ඌව පළාත් ප්‍රධාන අමාත්‍ය හා මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, අධ්‍යාපන, පළාත් පාලන, ඉඩම්, විදුලිබල හා බලශක්ති, ඉදිකිරීම්, ග්‍රාමීය යටිතල පහසුකම් අමාත්‍ය,
ඌව පළාත.

2019 මාර්තු මස 01 වැනි දින,
ඌව පළාත් ප්‍රධාන අමාත්‍ය කාර්යාලයේ දී ය.

1A PG 4509 — 12 (2019/05)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**නියෝග අංක 01**

**රාජකාරී ගමන් සඳහා ඉන්ධන සීමා නියම කිරීම**

1. මහා නගර සභා නගරාධිපතිවරුන්ට මහා නගර සභාවේ රාජකාරී ගමන් සඳහා ඉන්ධන සීමා නියම කිරීම.

   I. මහා නගර සභාවේ වාහන යොදවා ගන්නේ නම් මසකට ඉන්ධන ඩීසල් ලීටර් 400 නොවැඩි ප්‍රමාණයක්; හෝ
   II. මහ නගර සභාවේ වාහනයක් නොමැති වන අවස්ථාවක ඉහත ඉන්ධන සඳහා වැය සීමාව යටතේ විෂය භාර අමාත්‍යවරයාගේ අවසරය ලබා ගෙන පෞද්ගලික වාහන සඳහා සභා අරමුදලින් වැය දැරිය හැකිය.

**නියෝග අංක 02**

**සංයුක්ත දීමනා**

1. මහා නගර සභා නගරාධිපතිවරුන් සඳහා මසකට දින 10 ක උපරිමයකට යටත්ව හා ආයතන සංග්‍රහයේ විධිවිධානවලට යටත්ව සම්පූර්ණ දිනකට රුපියල් 1000/- කට නොවැඩි සංයුක්ත දීමනාවක් සභා අනුමැතිය මත ගෙවිය හැකිය.

2. සංයුක්ත දීමනාව ගෙවනු ලබන්නේ මහා නගර සභා ප්‍රදේශයෙන් පිට රාජකාරී ගමන් බිමන් සඳහා පමණි. ආයතන සංග්‍රහයේ විධිවිධානවලට අනුකූලව මෙම ගෙවීම් කළ යුතුය.

3. මහා නගර සභා බල ප්‍රදේශය තුළ කරනු ලබන ගමන් බිමන් සඳහා මෙම දීමනා ගෙවනු නොලැබේ.

4. ඉහත සඳහන් පරිදි ගමන් ගාස්තු හා සංයුක්ත දීමනා ලබා ගැනීමට හැකි වන්නේ අදාළ මහා නගර සභාව සම්බන්ධව රාජකාරී ඉටු කිරීම සඳහා ගිය ගමන් බිමන් සඳහා පමණි. මහා නගර සභාවේ කටයුතුවලට අදාළ උත්සවයක් සම්මන්ත්‍රණයක් හෝ රැස්වීමක් සඳහා නිල වශයෙන් ආරාධනාවක් ලැබුණු අවස්ථාවක හැර සම්මන්ත්‍රණයක් හෝ රැස්වීමකට සහභාගී වීමට යාම වෙනුවෙන් මහා නගර සභා අරමුදලින් ගමන් ගාස්තු හෝ සංයුක්ත දීමනාවක් හෝ ලබා ගැනීමට හිමිකම් නැත.

**නියෝග අංක 03**

**දුරකථන දීමනා**

1. නගරාධිපතිවරයාට හා නියෝජ්‍ය නගරාධිපතිවරයාට දුරකථනය වෙනුවෙන් සභා අරමුදලින් පහත සඳහන් පරිදි දීමනාවක් ලබා ගැනීමට අවසර දෙනු ලැබේ.

| | |
|---|---|
| I. නගරාධිපතිවරයාට මාසිකව | - රු. 7500/- |
| II. නියෝජ්‍ය නගරාධිපතිවරයාට මාසිකව | - රු. 5000/- |
| III. නාගරික මන්ත්‍රීවරයෙකුට මාසිකව | - රු. 3500/- |

**නියෝග අංක 04**

**කමිටු සඳහා සහභාගී වීමේ දීමනා**

1. මෙම නියෝග මහා නගර සභා ආඥා පනතේ (252 අධිකාරයේ) 26 (1) වගන්තිය ප්‍රකාරව පත් කරන ලද කමිටු සමාජිකයන්ට කමිටු සඳහා සහභාගී වීමේ දීමනා ගෙවීමේ නියෝග ලෙස හඳුන්වනු ලැබේ.

2. එම කමිටු සමාජිකයන්ට එක් කමිටුවකට සහභාගී වීම සඳහා රු.500/- ක දීමනාවක් සඳහා සභා අරමුදලින් වැය දැරිය හැකිය.

3. කමිටු සමාජිකයන්ට කමිටු සඳහා සහභාගී වීමේ දීමනා ගෙවීමේදී පහත සඳහන් කරුණු හා කොන්දේසි පිළිබඳ සැලකිලිමත් විය යුතුය.

I. මෙහි කමිටු යනුවෙන් අදහස් කරන්නේ මහා නගර සභා ආඥා පනතේ (252 අධිකාරයේ ) 26(1) වගන්තිය ප්‍රකාරව පත් කරන ලද විධිමත් කමිටුවක් වේ.

II. එක් එක් කමිටු සඳහා සහභාගී වීමේ දීමනාව ලැබීමට කමිටු සාමාජික අත්සන් ලේඛනය මගින් සහභාගීත්වය සනාථ කළ යුතු වේ.

4. යථෝක්ත සියළු ගෙවීම් සිදු කිරීමේදී මහා නගර සභා අරමුදලේ මූල්‍ය තත්ත්වය හා අයවැය වාර්තාවේ ප්‍රතිපාදන සලකා බලා නිශ්චිත ප්‍රතිශතයක් මහා සභා අනුමැතිය මත වෙන් කරගත යුතුය.

05 - 557/1

---

## ඌව පළාතේ පළාත් සභාව

ඌව පළාත් ප්‍රධාන අමාත්‍ය හා පළාත් පාලන විෂයභාර අමාත්‍ය දොන් ආතර් චාමර සම්පත් දසනායක වන මා විසින්, 1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතෙහි 2 වන වගන්තිය සමග කියවිය යුතු 252 අධිකාරය වන මහා නගර සභා ආඥා පනතේ 289 වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව සාදන ලද මහා නගර සභා නගරාධිපති, නියෝජ්‍ය නගරාධිපති හා නාගරික මන්ත්‍රීවරුන් සඳහා පහත සඳහන් දීමනාවලට අදාළ නියෝග මෙයින් පනවනු ලැබේ. මෙම නියෝග 2014.11.01 දින සිට ක්‍රියාත්මක විය යුතු අතර, එදිනට පෙර දින සිට ක්‍රියාත්මක වන පරිදි මෙම කරුණට අදාළව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1394/8 හා 2005.05.27 දිනැති *ගැසට් පත්‍රයේ* සඳහන් නියෝග පරිච්ඡින්න කරනු ලැබේ.

**දොන් ආතර් චාමර සම්පත් දසනායක,**
ඌව පළාත් ප්‍රධාන අමාත්‍ය හා මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, අධ්‍යාපන, පළාත් පාලන, ඉඩම්, විදුලිබල හා බලශක්ති, ඉදිකිරීම්, ග්‍රාමීය යටිතල පහසුකම් අමාත්‍ය,
ඌව පළාත.

2019 මාර්තු මස 01 වැනි දින,
ඌව පළාත් ප්‍රධාන අමාත්‍ය කාර්යාලයේ දී ය.

### නියෝග අංක 01

### මහජන නියෝජිතයන්ට ගෙවනු ලබන මාසික දීමනාව

1. මෙම නියෝග ඌව පළාතේ මහා නගර සභා නගරාධිපතිවරුන්ට, නියෝජ්‍ය නගරාධිපතිවරුන්ට හා නාගරික මන්ත්‍රීවරුන්ට දීමනා ගෙවීමේ නියෝග ලෙස හඳුන්වනු ලැබේ.
2. ඌව පළාතේ මහා නගර සභා සඳහා තේරී පත්වන මහා නගර සභා නගරාධිපතිවරුන්ට, නියෝජ්‍ය නගරාධිපතිවරුන්ට හා නාගරික මන්ත්‍රීවරුන්ට පහත සඳහන් පරිදි වූ මාසික දීමනාවක් 2014 නොවැම්බර් 01 වැනි දින සිට ගෙවිය හැකි වේ.

| | |
|---|---|
| I. නගරාධිපති | - රු. 30,000.00 |
| II. නියෝජ්‍ය නගරාධිපති | - රු. 25,000.00 |
| III. නාගරික මන්ත්‍රී | - රු. 20,000.00 |

3. (1) පහත සඳහන් අවස්ථාවන්හි දී මහා නගර සභා නගරාධිපතිවරයෙකු, නියෝජ්‍ය නගරාධිපතිවරයෙකු හෝ නාගරික මන්ත්‍රීවරයෙකු යථෝක්ත දීමනා සම්බන්ධයෙන් හිමිකමක් නොලබයි.

(i). දීමනා ගෙවීමට අදාළ මාසයේ පවත්වන ලද සභා රැස්වීම් සහ කාරක සභා රැස්වීම්වලට සහභාගී නොවීම.
(ii). කිසියම් සාපරාධී චෝදනාවකට අදාළව රැඳවුම්භාරයේ හෝ සිරගතව සිටීම.
(iii). වෛද්‍ය හේතූන් මත හැර සභාවේ විධිමත් අනුමැතියකින් තොරව නිවාඩු ලබා සිටීම.
(iv). සභාවේ කාර්යයන්ට පරිබාහිර වූ පෞද්ගලික කාර්යයන් සඳහා විදේශ ගතව සිටීම.

(v). ඌව පළාතේ පළාත් සභාවේ 2011 අංක 02 දරන ඌව පළාතේ පළාත් පාලන ආයතනවල පරිපාලන අධීක්ෂණය කිරීමේ බලය පිළිබඳ ප්‍රඥප්තියේ ප්‍රතිපාදන අනුව මහා නගර සභාවක නගරාධිපති, නියෝජ්‍ය නගරාධිපති හා නාගරික මන්ත්‍රීවරුන්ගේ කටයුතු අත්හිටුවා තිබීම.

එසේ වුවද රැඳවුම් භාරයේ සිටි හෝ සිරගතව සිටි හෝ නිවාඩු ලබා සිටි හෝ සේවය අත්හිටුවා සිටි කාලය කිසියම් මාසයකින් කොටසක් වන අවස්ථාවේ දී එම මාසයේ ඉතිරි කාලය සඳහා දින අනුපාතිකව ගණන් බලා දීමනා ගෙවනු ලැබිය හැකිය.

(2) ඉහත 3(1) වන වගන්තියෙහි කුමක් සඳහන් වුවද, නගරාධිපතිවරයෙකු, නියෝජ්‍ය නගරාධිපතිවරයෙකු හෝ නාගරික මන්ත්‍රීවරයෙකු රාජකාරී කර්තව්‍යයක් සඳහා විධිමත් අනුමැතියකින් යුතුව නිරත වන අවස්ථාවක සභා රැස්වීමට හෝ කාරක සභා රැස්වීමට සහභාගී නොවීමේ හේතුව මත ඔහුගේ දීමනාව අහිමි නොවිය යුතුය.

(3) මහා නගර සභා ආඥාපනතේ (252 අධිකාරයේ ) 13 වගන්තිය ප්‍රකාරව, යම් සභිකයෙකුගේ ධූරය ප්‍රතික්ෂේප කිරීම, ධූරයෙන් ඉල්ලා අස්වීම, ධූරය හිස්වීම යන අවස්ථාවන් සහ සභාව විසුරුවාහැර ඇති අවස්ථාවක එම දිනය අදාළ මාසයේ අවසන් දිනයට පෙර දිනයක් වූ විට අදාළ මාසික සභික දීමනාව එම මාසයේ දින අනුපාතිකව ගලපා ගෙවීම් සිදු කළ යුතුය.

05 - 557/ 2

---

## ඌව පළාතේ පළාත් සභාව

ඌව පළාතේ ප්‍රධාන අමාත්‍ය හා පළාත් පාලන විෂයභාර අමාත්‍ය දොන් ආතර් චාමර සම්පත් දසනායක වන මා විසින්, 1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතෙහි 2 වන වගන්තිය සමඟ කියවිය යුතු 255 අධිකාරය වන නගර සභා ආඥාපනතේ 193 වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව සාදන ලද නගර සභා සභාපති, උප සභාපති හා නාගරික මන්ත්‍රීවරුන් සඳහා පහත සඳහන් දීමනාවලට අදාළ රීති මෙයින් පනවනු ලැබේ. ඉන්ධන හා දුරකථන දීමනා සම්බන්ධව මෙම රීති 2018.06.30 දින සිට ක්‍රියාත්මක විය යුතු අතර, සංයුක්ත දීමනා හා කමිටු සඳහා සහභාගී වීමේ දීමනාව සම්බන්ධ රීති 2019.02.01 දින සිට ක්‍රියාත්මක විය යුතුය.

**දොන් ආතර් චාමර සම්පත් දසනායක,**
ඌව පළාත් ප්‍රධාන අමාත්‍ය හා මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, අධ්‍යාපන, පළාත් පාලන, ඉඩම්, විදුලිබල හා බලශක්ති, ඉදිකිරීම්, ග්‍රාමීය යටිතල පහසුකම් අමාත්‍ය,
ඌව පළාත.

2019 මාර්තු මස 01 වැනි දින,
ඌව පළාත් ප්‍රධාන අමාත්‍ය කාර්යාලයේ දී ය.

### රීති අංක 01

### රාජකාරී ගමන් සඳහා ඉන්ධන සීමා නියම කිරීම

1. නගර සභා නගරාධිපතිවරුන්ට නගර සභාවේ රාජකාරී ගමන් සඳහා ඉන්ධන සීමා නියම කිරීම.

I. නගර සභාවේ වාහන යොදවා ගන්නේ නම් මසකට ඉන්ධන ඩීසල් ලීටර් 400 නොවැඩි ප්‍රමාණයක්; හෝ

II. නගර සභාවේ වාහනයක් නොමැති වන අවස්ථාවක ඉහත ඉන්ධන සඳහා වැය සීමාව යටතේ විෂය භාර අමාත්‍යවරයාගේ අවසරය ලබා ගෙන පෞද්ගලික වාහන සඳහා සභා අරමුදලින් වැය දැරිය හැකිය.

**රීති අංක 02**

**සංයුක්ත දීමනා**

1. නගර සභා සභාපතිවරුන් සඳහා මසකට දින 10 ක උපරිමයකට යටත්ව හා ආයතන සංග්‍රහයේ විධිවිධානවලට යටත්ව සම්පූර්ණ දිනකට රුපියල් 1000/- කට නොවැඩි සංයුක්ත දීමනාවක් සභා අනුමැතිය මත ගෙවිය හැකිය.

2. සංයුක්ත දීමනාව ගෙවනු ලබන්නේ නගර සභා ප්‍රදේශයෙන් පිට රාජකාරී ගමන් බිමන් සඳහා පමණි. ආයතන සංග්‍රහයේ විධිවිධානවලට අනුකූලව මෙම ගෙවීම් කළ යුතුය.

3. නගර සභා බල ප්‍රදේශ තුළ කරනු ලබන ගමන් බිමන් සඳහා මෙම දීමනා ගෙවනු නොලැබේ.

4. ඉහත සඳහන් පරිදි ගමන් ගාස්තු හා සංයුක්ත දීමනා ලබා ගැනීමට හැකි වන්නේ අදාළ නගර සභාව සම්බන්ධව රාජකාරී ඉටු කිරීම සඳහා ගිය ගමන් බිමන් සඳහා පමණි. නගර සභාවේ කටයුතුවලට අදාළ උත්සවයක්, සම්මන්ත්‍රණයක් හෝ රැස්වීමක් සඳහා නිල වශයෙන් ආරාධනාවක් ලැබුණු අවස්ථාවක හැර සම්මන්ත්‍රණයක් හෝ රැස්වීමකට සහභාගී වීමට යාම වෙනුවෙන් නගර සභා අරමුදලින් ගමන් ගාස්තු හෝ සංයුක්ත දීමනා ලබා ගැනීමට හිමිකම් නැත.

**රීති අංක 03**

**දුරකථන දීමනා**

1. සභාපතිවරයාට හා උප සභාපතිවරයාට දුරකථනය වෙනුවෙන් සභා අරමුදලින් පහත සඳහන් පරිදි දීමනාවක් ලබා ගැනීමට අවසර දෙනු ලැබේ.

| | |
|---|---|
| I. සභාපතිවරයාට මාසිකව | - රු. 6000/- |
| II. උප සභාපතිවරයාට මාසිකව | - රු. 3000/- |
| III. නාගරික මන්ත්‍රීවරයෙකුට මාසිකව | - රු. 1000/- |

**රීති අංක 04**

**කමිටු සඳහා සහභාගීවීමේ දීමනා**

1. මෙම නියෝග නගර සභා ආඥා පනතේ (255 අධිකාරයේ) 29 වගන්තිය ප්‍රකාරව පත් කරන ලද කමිටු සාමාජිකයන්ට කමිටු සඳහා සහභාගී වීමේ දීමනා ගෙවීමේ නියෝග ලෙස හඳුන්වනු ලැබේ.

2. එම කමිටු සාමාජිකයන්ට එක් කමිටුවකට සහභාගී වීම සඳහා රු.500/- ක දීමනාවක් සඳහා සභා අරමුදලින් වැය දැරිය හැකිය.

3. කමිටු සාමාජිකයන්ට කමිටු සඳහා සහභාගී වීමේ දීමනා ගෙවීමේදී පහත සඳහන් කරුණු හා කොන්දේසි පිළිබඳව සැලකිලිමත් විය යුතුය.

    I. මෙහි කමිටු යනුවෙන් අදහස් කරන්නේ නගර සභා ආඥා පනතේ (255 අධිකාරයේ ) 29 වගන්තිය ප්‍රකාරව පත් කරන ලද විධිමත් කමිටුවක් වේ.

    II. එක් එක් කමිටු සඳහා සහභාගී වීමේ දීමනාව ලැබීමට කමිටු සමාජික අත්සන් ලේඛනය මගින් සහභාගීත්වය සනාථ කළ යුතු ය.

4. යථොක්ත සියලු ගෙවීම් සිදු කිරීමේදී නගර සභා අරමුදලේ මූල්‍ය තත්වය හා අයවැය වාර්තාවේ ප්‍රතිපාදන සලකා බලා නිශ්චිත ප්‍රතිශතයක් මහා සභා අනුමැතිය මත වෙන් කරගත යුතුය.

05 - 557/3

## ඌව පළාතේ පළාත් සභාව

ඌව පළාතේ ප්‍රධාන අමාත්‍ය හා පළාත් පාලන විෂයභාර අමාත්‍ය දොන් ආතර් චාමර සම්පත් දසනායක වන මා විසින්, 1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතෙහි 2 වන වගන්තිය සමඟ කියවිය යුතු 255 අධිකාරයවන නගර සභා ආඥාපනතේ 193 වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව සාදන ලද නගර සභා සභාපති, උපසභාපති හා නාගරික මන්ත්‍රීවරුන් සඳහාවන දීමනාවලට අදාළ රීති මෙයින් පනවනු ලැබේ. මෙම රීති 2014.11.01 දින සිට ක්‍රියාත්මක විය යුතු අතර, එදිනට පෙර දින සිට ක්‍රියාත්මක වන පරිදි මෙම කරුණට අදළව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1394/8 හා 2005.05.27 දිනැති *ගැසට් පත්‍රයේ* සඳහන් රීති පරිච්ජින්න කරනු ලැබේ.

**දොන් ආතර් චාමර සම්පත් දසනායක,**
ඌව පළාත් ප්‍රධාන අමාත්‍ය හා මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, අධ්‍යාපන, පළාත් පාලන, ඉඩම්, විදුලිබල හා බලශක්ති, ඉදිකිරීම්, ග්‍රාමීය යටිතල පහසුකම් අමාත්‍ය,
ඌව පළාත.

2019 මාර්තු මස 01 වැනි දින,
ඌව පළාත් ප්‍රධාන අමාත්‍ය කාර්යාලයේ දී ය.

### රීති අංක 01

### මහජන නියෝජිතයින්ට ගෙවනු ලබන මාසික දීමනාව

1. මෙම නියෝග ඌව පළාතේ නගර සභා සභාපතිවරුන්ට, උප සභාපතිවරුන්ට හා නාගරික මන්ත්‍රීවරුන්ට දීමනා ගෙවීමේ රීති ලෙස හඳුන්වනු ලැබේ.
2. ඌව පළාතේ නගර සභා සඳහා තේරී පත්වන නගර සභා සභාපතිවරුන්ට, උප සභාපතිවරුන්ට හා නාගරික මන්ත්‍රීවරුන්ට පහත සඳහන් පරිදි වූ මාසික දීමනාවක් 2014.11.01 වැනි දින සිට ගෙවිය හැකි වේ.

| | |
|---|---|
| I. සභාපති | - රු. 25,000.00 |
| II. උප සභාපති | - රු. 20,000.00 |
| III. නාගරික මන්ත්‍රී | - රු. 15,000.00 |

3. (1) පහත සඳහන් අවස්ථාවන්හි දී සභාපතිවරයෙකු, උප සභාපතිවරයෙකු හෝ නාගරික මන්ත්‍රීවරයෙකු යථෝක්ත දීමනා සම්බන්ධයෙන් හිමිකමක් නොලබයි.

   (i). දීමනා ගෙවීමට අදාළ මාසයේ පවත්වන ලද සභා රැස්වීම් සහ කාරක සභා රැස්වීම්වලට සහභාගී නොවීම.
   (ii). කිසියම් සාපරාධී චෝදනාවකට අදාළව රැඳවුම්භාරයේ හෝ සිරගතව සිටීම.
   (iii). වෛද්‍ය හේතුන් මත හැර සභාවේ විධිමත් අනුමැතියකින් තොරව නිවාඩු ලබා සිටීම.
   (iv). සභාවේ කාර්යයන්ට පරිබාහිර වූ පෞද්ගලික කාර්යයන් සඳහා විදේශ ගතව සිටීම.
   (v). ඌව පළාතේ පළාත් සභාවේ 2011 අංක 02 දරන ඌව පළාතේ පළාත් පාලන ආයතනවල පරිපාලන අධීක්ෂණය කිරීමේ බලය පිළිබඳ ප්‍රඥප්තියේ ප්‍රතිපාදන අනුව නගර සභාවක සභාපති, උප සභාපති හා නාගරික මන්ත්‍රීවරුන්ගේ කටයුතු අත්හිටුවා තිබීම.

   එසේ වුවද රැඳවුම් භාරයේ සිටි හෝ සිරගතව සිටි හෝ නිවාඩු ලබා සිටි හෝ සේවය අත්හිටුවා සිටි කාලය කිසියම් මාසයකින් කොටසක්වන අවස්ථාවේ දී එම මාසයේ ඉතිරි කාලය සඳහා දින අනුපාතිකව ගණන් බලා දීමනා ගෙවනු ලැබිය හැකිය.

(2) ඉහත 3(1) වන වගන්තියෙහි කුමක් සඳහන් වුවද, නගර සභාවක සභාපතිවරයෙකු උප සභාපතිවරයෙකු හෝ නාගරික මන්ත්‍රීවරයෙකු රාජකාරී කර්තව්‍යයක් සඳහා විධිමත් අනුමැතියකින් යුතුව නිරතවන අවස්ථාවක සභා රැස්වීමට හෝ කාරක සභා රැස්වීමකට සහභාගී නොවීමේ හේතුව මත ඔහුගේ දීමනාව අහිමි නොවිය යුතුය.

(3) නගර සභා ආඥා පනතේ (255 අධිකාරයේ ) 12 වගන්තිය ප්‍රකාරව, යම් සභිකයෙකුගේ ධූරය ප්‍රතික්ෂේප කිරීම, ධූරයෙන් ඉල්ලා අස්වීම, ධූරය හිස්වීම යන අවස්ථාවන් සහ සභාව විසුරුවාහැර ඇති අවස්ථාවක එම දිනය අදාළ මාසයේ අවසන් දිනයට පෙර දිනයක් වූ විට අදාළ මාසික සභික දීමනාව එම මාසයේ දින අනුපාතිකව ගලපා ගෙවීම සිදු කළ යුතුය.

05 - 557/ 4

---

## ඌව පළාතේ පළාත් සභාව

ඌව පළාතේ ප්‍රධාන අමාත්‍ය හා පළාත් පාලන විෂයභාර අමාත්‍ය දොන් ආතර් චාමර සම්පත් දසනායක වන මා විසින්, 1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතෙහි 2 වන වගන්තිය සමඟ කියවිය යුතු 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 184 වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව සාදන ලද ප්‍රාදේශීය සභා සභාපති, උප සභාපති හා ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන් සඳහා පහත සඳහන් දීමනාවලට අදාළ රීති මෙයින් පනවනු ලැබේ. ඉන්ධන හා දුරකථන දීමනා සම්බන්ධව මෙම රීති 2018.06.30 දින සිට ක්‍රියාත්මක විය යුතු අතර, සංයුක්ත දීමනා හා කමිටු සඳහා සහභාගීවීමේ දීමනාව සම්බන්ධ රීති 2019.02.01 දින සිට ක්‍රියාත්මක විය යුතුය.

**දොන් ආතර් චාමර සම්පත් දසනායක,**
ඌව පළාත් ප්‍රධාන අමාත්‍ය හා මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා
සාමය, අධ්‍යාපන, පළාත් පාලන, ඉඩම්, විදුලිබල හා බලශක්ති,
ඉදිකිරීම්, ග්‍රාමීය යටිතල පහසුකම් අමාත්‍ය,
ඌව පළාත.

2019 මාර්තු මස 01 වැනි දින,
ඌව පළාත් ප්‍රධාන අමාත්‍ය කාර්යාලයේ දී ය.

### රීති අංක 01

### රාජකාරි ගමන් සඳහා ඉන්ධන සීමා නියම කිරීම

1. ප්‍රාදේශීය සභා සභාපතිවරුන්ට ප්‍රාදේශීය සභාවේ රාජකාරි ගමන් සඳහා ඉන්ධන සීමා නියම කිරීම.

   I. ප්‍රාදේශීය සභාවේ වාහන යොදවා ගන්නේ නම් මසකට ඉන්ධන ඩීසල් ලීටර් 400 නොවැඩි ප්‍රමාණයක්; හෝ

   II. ප්‍රාදේශීය සභාවේ වාහනයක් නොමැතිවන අවස්ථාවක ඉහත ඉන්ධන සඳහා වැය සීමාව යටතේ විෂය භාර අමාත්‍යවරයාගේ අවසරය ලබා ගෙන පෞද්ගලික වාහන සඳහා සභා අරමුදලින් වැය දැරිය හැකිය.;

### රීති අංක 02

### සංයුක්ත දීමනා

1. ප්‍රාදේශීය සභා සභාපතිවරුන් සඳහා මසකට දින 10 ක උපරිමයකට යටත්ව හා ආයතන සංග්‍රහයේ විධිවිධානවලට යටත්ව සම්පූර්ණ දිනකට රුපියල් 1000/- කට නොවැඩි සංයුක්ත දීමනාවක් සභා අනුමැතිය මත ගෙවිය හැකිය.

2. සංයුක්ත දීමනාව ගෙවනු ලබන්නේ ප්‍රාදේශීය සභා ප්‍රදේශයෙන් පිට රාජකාරි ගමන් බිමන් සඳහා පමණි. ආයතන සංග්‍රහයේ විධිවිධානවලට අනුකූලව මෙම ගෙවීම් කළ යුතුය.

3. ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ කරනු ලබන ගමන් බිමන් සඳහා මෙම දීමනා ගෙවනු නොලැබේ.

4. ඉහත සඳහන් පරිදි ගමන් ගාස්තු හා සංයුක්ත දීමනා ලබා ගැනීමට හැකි වන්නේ අදාළ ප්‍රාදේශීය සභාව සම්බන්ධව රාජකාරි ඉටු කිරීම සඳහා ගිය ගමන් බිමන් සඳහා පමණි. ප්‍රාදේශීය සභාවේ කටයුතුවලට අදාළ උත්සවයක් සම්මන්ත්‍රණයක් හෝ රැස්වීමක් සඳහා නිල වශයෙන් ආරාධනාවක් ලැබුණු අවස්ථාවක හැර සම්මන්ත්‍රණයක් හෝ රැස්වීමකට සහභාගිවීමට යාම වෙනුවෙන් ප්‍රාදේශීය සභා අරමුදලින් ගමන් ගාස්තු හෝ සංයුක්ත දීමනා හෝ ලබා ගැනීමට හිමිකම් නැත.

**රීති අංක 03**

**දුරකථන දීමනා**

1. සභාපතිවරයාට හා උපසභාපතිවරයාට දුරකථනය වෙනුවෙන් සභා අරමුදලින් පහත සඳහන් පරිදි දීමනාවක් ලබා ගැනීමට අවසර දෙනු ලැබේ.

| | |
|---|---|
| I. සභාපතිවරයාට මාසිකව | - රු. 6000/- |
| II. උපසභාපතිවරයාට මාසිකව | - රු. 3000/- |
| III. ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරයෙකුට මාසිකව | - රු. 1000/- |

**රීති අංක 04**

**කමිටු සඳහා සහභාගිවීමේ දීමනා**

1. මෙම රීති 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 12 වගන්ති ප්‍රකාරව පත් කරන ලද කමිටු සාමාජිකයන්ට කමිටු සඳහා සහභාගිවීමේ දීමනා ගෙවීමේ රීති ලෙස හඳුන්වනු ලැබේ.

2. එම කමිටු සාමාජිකයන්ට එක් කමිටුවකට සහභාගි වීම සඳහා රු.500/- ක දීමනාවක් සඳහා සභා අරමුදලින් වැය දැරිය හැකිය.

3. කමිටු සාමාජිකයන්ට කමිටු සඳහා සහභාගි වීමේ දීමනා ගෙවීමේදී පහත සඳහන් කරුණු හා කොන්දේසි පිළිබඳ සැලකිලිමත් විය යුතුය.

    I. මෙහි කමිටු යනුවෙන් අදහස් කරන්නේ 1987 අංක 15 දරන ප්‍රදේශීය සභා පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව පත් කරන ලද විධිමත් කමිටුවක් වේ.

    II. එක් එක් කමිටු සඳහා සහභාගිවීමේ දීමනාව ලැබීමට කමිටු සාමාජික අත්සන් ලේඛනය මගින් සහභාගිත්වය සනාථ කළ යුතු වේ.

4. යථෝක්ත සියලු ගෙවීම් සිදු කිරීමේදී ප්‍රාදේශීය සභා අරමුදලේ මුල්‍ය තත්වය හා අයවැය වාර්තාවේ ප්‍රතිපාදන සලකා බලා නිශ්චිත ප්‍රතිශතයක් මහා සභා අනුමැතිය මත වෙන් කරගත යුතුය.

05 - 557/5

---

**ඌව පළාතේ පළාත් සභාව**

ඌව පළාතේ ප්‍රධාන අමාත්‍ය හා පළාත් පාලන විෂයභාර අමාත්‍ය දොන් ආතර් චාමර සම්පත් දසනායක වන මා විසින්, 1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතෙහි 2 වන වගන්තිය සමග කියවිය යුතු 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 184 වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව සාදන ලද ප්‍රාදේශීය සභා සභාපති, උප සභාපති හා ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන් සඳහා දීමනාවලට අදාළ රීති මෙයින් පනවනු ලැබේ. මෙම රීති 2014.11.01 දින සිට ක්‍රියාත්මක විය යුතු අතර, එදිනට පෙර දින සිට ක්‍රියාත්මක වන පරිදි මෙම කරුණට අදළව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1394/8 හා 2005.05.27 දිනැති *ගැසට් පත්‍රයේ* සඳහන් රීති පරිච්ජින්න කරනු ලැබේ.

**දොන් ආතර් චාමර සම්පත් දසනායක,**
ඌව පළාත් ප්‍රධාන අමාත්‍ය හා මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, අධ්‍යාපන, පළාත් පාලන, ඉඩම්, විදුලිබල හා බලශක්ති, ඉදිකිරීම්, ග්‍රාමීය යටිතල පහසුකම් අමාත්‍ය,
ඌව පළාත.

2019 මාර්තු මස 01 වැනි දින,
ඌව පළාත් ප්‍රධාන අමාත්‍ය කාර්යාලයේ දී ය.

**රීති අංක 01**

**මහජන නියෝජිතයින්ට ගෙවනු ලබන මාසික දීමනාව**

1. මෙම නියෝග ඌව පළාතේ ප්‍රාදේශීය සභා සභාපතිවරුන්ට, උප සභාපතිවරුන්ට හා ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන්ට දීමනා ගෙවීමේ රීති ලෙස හඳුන්වනු ලැබේ.
2. ඌව පළාතේ ප්‍රාදේශීය සභා සඳහා තේරී පත්වන ප්‍රාදේශීය සභා සභාපතිවරුන්ට, උප සභාපතිවරුන්ට හා ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන්ට පහත සඳහන් පරිදි වූ මාසික දීමනාවක් 2014.11.01 වැනි දින සිට ගෙවිය හැකි වේ.

| | | | |
|---|---|---|---|
| I. | සභාපති | - | රු. 25,000.00 |
| II. | උප සභාපති | - | රු. 20,000.00 |
| III. | නාගරික මන්ත්‍රී | - | රු. 15,000.00 |

3. (1) පහත සඳහන් අවස්ථාවන්හි දී සභාපතිවරයෙකු, උප සභාපතිවරයෙකු හෝ ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරයෙකු යථෝක්ත දීමනා සම්බන්ධයෙන් හිමිකමක් නොලබයි.

   (i) දීමනා ගෙවීමට අදාළ මාසයේ පවත්වන ලද සභා රැස්වීම් සහ කාරක සභා රැස්වීම්වලට සහභාගි නොවීම.
   (ii) කිසියම් සාපරාධී චෝදනාවකට අදාළව රැඳවුම්භාරයේ හෝ සිරගතව සිටීම.
   (iii) වෛද්‍ය හේතූන් මත හැර සභාවේ විධිමත් අනුමැතියකින් තොරව නිවාඩු ලබා සිටීම.
   (iv) සභාවේ කාර්යයන්ට පරිබාහිර වූ පෞද්ගලික කාර්යයන් සඳහා විදේශ ගතව සිටීම.
   (v) ඌව පළාතේ පළාත් සභාවේ 2011 අංක 2 දරන ඌව පළාතේ පළාත් පාලන ආයතනවල පරිපාලන අධීක්ෂණය කිරීමේ බලය පිළිබඳ ප්‍රඥප්තියේ ප්‍රතිපාදන අනුව ප්‍රාදේශීය සභාවක සභාපති, උප සභාපති හා ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන්ගේ කටයුතු අත්හිටුවා තිබීම.

එසේ වුවද රැඳවුම් භාරයේ සිටි හෝ සිරගතව සිටි හෝ නිවාඩු ලබා සිටි හෝ සේවය අත්හිටුවා සිටි කාලය කිසියම් මාසයකින් කොටසක් වන අවස්ථාවේ දී එම මාසයේ ඉතිරි කාලය සඳහා දින අනුපාතිකව ගණන් බලා දීමනා ගෙවනු ලැබිය හැකිය.

(2) ඉහත 3(1) වන වගන්තියෙහි කුමක් සඳහන් වුවද, සභාපතිවරයෙකු, උප සභාපතිවරයෙකු හෝ ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරයෙකු රාජකාරි කර්තව්‍යයක් සඳහා විධිමත් අනුමැතියකින් යුතුව නිරතවන අවස්ථාවක සභා රැස්වීමට හෝ කාරක සභා රැස්වීමකට සහභාගි නොවීමේ හේතුව මත ඔහුගේ දීමනාව අහිමි නොවිය යුතුය.

(3) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 7 වගන්තිය ප්‍රකාරව, යම් සභිකයෙකුගේ ධූරය ප්‍රතික්ෂේප කිරීම, ධූරයෙන් ඉල්ලා අස්වීම, ධූරය හිස්වීම යන අවස්ථාවන් සහ සභාව විසුරුවා හැර ඇති අවස්ථාවක එම දිනය අදාළ මාසයේ අවසන් දිනයට පෙර දිනයක් වූ විට අදාළ මාසික සභික දීමනාව එම මාසයේ දින අනුපාතිකව ගලපා ගෙවීම් සිදු කළ යුතුය.

05 - 557/6

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.